ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන **2020/2021**
අවසාන පරීක්ෂණය - **2022**

**SNPA609- විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රම.**

**කාලය - පැය තුන (03) යි.**

---

දිනය : 2022.09.17 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**ප්‍රශ්න <u>අංක 01</u> සහ තවත් ප්‍රශ්න <u>තුනකට (03)</u> පිළිතුරු සපයන්න.**

01. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපනඥයෙකු ලෙස, පහත සඳහන් අංශ යටතේ ගුණාත්මක පර්යේෂණයක් සිදු කරන ලෙස ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය ඔබගෙන් ඉල්ලා ඇත.

ඒ. විශේෂ පාසල්

බී. ඒකීකරණ අධ්‍යාපන පද්ධතිය

සී. අන්තර්කරණ අධ්‍යාපනය

i) ඉහත සඳහන් කළ එක් අංශයකට අදාළව ගුණාත්මක පර්යේෂණයක් සිදු කිරීම සඳහා ඔබ තෝරාගත් පර්යේෂණ ගැටලුවක් සඳහන් කරන්න. (ලකුණු 05)

ii) ඔබ තෝරාගත් පර්යේෂණ ගැටලුවේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 04)

iii) අධ්‍යයනයේ අරමුණු සඳහන් කර, තෝරාගත් ගැටලුවට අදාළ පර්යේෂණ ප්‍රශ්න හතරක් **(04)** සකස් කරන්න. (ලකුණු 08)

iv) ඔබේ පර්යේෂණ ගැටලුව සඳහා සුදුසු ගුණාත්මක පර්යේෂණ පිරිසැලසුමක් තෝරාගෙන එය හේතු තුනක් **(03)** මගින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

v) අධ්‍යයනයේ සහභාගිවන්නන් සඳහන් කර, එම තෝරා ගැනීමේ ක්‍රියාවලිය සාධාරණීකරණය කරමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

vi) ඔබගේ අධ්‍යයනය සඳහා සුදුසු දත්ත රැස් කිරීමේ ක්‍රියාපටිපාටි සහ ඔබ දත්ත රැස් කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

vii) දත්ත ගවේෂණය, දත්ත කේතනය, දත්ත ප්‍රවර්ගවලට වෙන් කරමින් තේමා සංවර්ධනය යනාදිය ඇතුළත්ව ඔබගේ අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණ ක්‍රියාවලිය සාකච්ඡා කරන්න. (ලකුණු 06

viii) ඔබ අධ්‍යයනයේ අනාවරණයන් බෙදා හැරීමට සැලසුම් කරන්නේ කෙසේ ද? (ලකුණු 03)

එකතුව (ලකුණු 40)

02. ඒ. "ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය" යන යෙදුම පැහැදිලි කරන්න. (ලකුණු 05)

බී. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ සුවිශේෂී ලක්ෂණ පෙන්වා දෙන්න. (ලකුණු 07)

සී. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ ඇති වැදගත්කම උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ලකුණු 20)

03. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යොදාගත හැකි ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයට අයත් වඩාත් ජනප්‍රිය පර්යේෂණ පිරිසැලසුම් දෙකක් **(02)** තෝරාගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඒ. ඔබ ඉහත පර්යේෂණ පිරිසැලසුම් දෙක **(02)** තෝරා ගත්තේ ඇයිද යන්න සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

බී. තෝරාගත් එක් එක් පිරිසැලසුම්වල සුවිශේෂී ලක්ෂණ තුනක් **(03)** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

සී. එක් එක් පර්යේෂණ සැලසුම්වල ප්‍රබලතා තුනක් **(03)** සහ සීමාවන් තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(ලකුණු 20)

04. ඒ. පර්යේෂණයේදී නියැදිකරණ ශිල්පීය ක්‍රම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 06)

බී. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය තුළ වඩාත් ජනප්‍රිය නියැදිකරණ ක්‍රම දෙකක් **(02)** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

සී. එක් එක් නියැදිකරණ ශිල්පීය ක්‍රමවල ප්‍රබලතා හතරක් **(04)** සහ සීමාවන් හතරක් **(04)** පෙන්වා දෙන්න. (ලකුණු 07)

(ලකුණු 20)